

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
# CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | CSS/7/7/5 | ඔබේ අංකය / உமது இல / Your No. | | දිනය / திகதி / Date | 2014.06. 25 |

දකුණු පළාත් සභාවේ
සියළුම ප්‍රධාන ගණන්දීමේ හා ගණන්දීමේ නිලධාරීන් වෙත.

**<u>උපචිත පදනම යටතේ ගිණුම් තැබීමේ දී ස්ථාවර හා ජංගම වත්කම් වාර්තා කිරීම සඳහා කේත අංක හඳුන්වා දීම.</u>**

උක්ත කාරණය සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්ගේ අංක CSS/9/1/2 හා 2013.08.08 දිනැති ලිපිය සමඟ මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SA/AS/AA/Circular හා 2013.07.12 දිනැති ලිපිය සහ අංක GFS/02 හා 2013.05.06 දිනැති ලිපිය උපචිත පදනම යටතේ ගිණුම් පිළියෙල කිරීමට උපදෙස් හා මගපෙන්වීම් වශයෙන් ඔබවෙත එවන ලදී.

එමගින් දී ඇති උපදෙස් පරිදි ඔබ අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි සහ ඉඩම් තක්සේරු කිරීමේ කාර්යය තක්සේරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී සිදු කළයුතු බවත්. ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් ස්ථාවර වත්කම් නම් ආයතන මට්ටමින් ස්වාධීන තක්සේරු මණ්ඩල පිහිටුවා තක්සේරු කිරීමේ කාර්යය සිදුකළ යුතු බවත් දැනුම් දී ඇත. ඒ අනුව වත්කම් පිරිවැය හඳුනාගතහැකි අවස්ථාවල එම වත්කමේ පිරිවැය හෝ පිරිවැය හඳුනාගත නොහැකි අවස්ථාවල තක්සේරු වටිනාකම් ගිණුම්වල ඇතුළත් කිරීමට පියවර ගත යුතුව ඇත.

ඉහත චක්‍රලේඛ ලිපි මගින් දී ඇති උපදෙස් අනුව ස්ථාවර වත්කම් තක්සේරු කිරීම හා ගිණුම් ගත කිරීම පිළිබඳ ප්‍රගතිය නොපමාව මා වෙත වාර්තා කරන ලෙස කාරුණිකව දන්වමි.මේ වන විටත් වත්කම් තක්සේරු කිරීමේ කටයුතු අවසන් කර නොමැති නම් ඒ පිළිබඳව නොපමාව කටයුතු කරන ලෙස වැඩිදුරටත් දැනුම් දෙමි.තවද ඔබ අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය පිළිබඳ නිරවුල් නොවූ ගැටළු පවතී නම් ඒවා නොපමාව නිරවුල් කර අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු බවත් දන්වමි.

ඩබ්ලිව්.කේ.කේ.අතුකෝරල,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත :- 01. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, කොළඹ 01 : දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ. : දැ.ගැ.ස.
03. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ. : දැ.ගැ.ස.


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary | 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office | 091 2234052 / 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax | 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இணையம் / Web site | www.cs.sp.gov.lk |

ප්‍රධාන ලේකම් කාර්යාලය, එච් එච්.දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச் தஹநாயக மாவத்தை, காலி.

"විශිෂ්ටත්වයෙන් ① වන යහපාලනයක්"